දෙවන පරිච්ඡේදය
තක්සේරු වන සේවා නියුක්ති ආදායම
(Assessable Employment Income)

JMC vLearning

ඉගෙනුම් ඵල

මෙම පරිච්ඡේදය අවසානයේදී ඔබට,

- 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත යටතේ යම් තැනැත්තෙකු සතු ප්‍රධාන ආදායම් ප්‍රභවයන් හඳුනා ගැනීමට
- සේවා නියුක්ත ආදායම යටතේ ඇතුළත් විවිධ ආදායම් මූලාශ්‍රයන් හඳුනාගැනීමට සේවා නියුක්ත ආදායම ගණනයේදී බැහැර කළ යුතු සහ නිදහස් ආදායම් මූලාශ්‍රයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට
- තක්සේරු කළ හැකි සේවා නියුක්ත ආදායම ගණනය කිරීමට සහ
- අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සම්බන්ධව මූලික අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

2.1 හැඳින්වීම

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත අනුව යම් පුද්ගලයෙකුගේ බද්දට යටත් වන ආදයම ප්‍රභවයන් 04 කි.

1. සේවා නියුක්ති ආදායම
2. ව්‍යාපාරයේ ආදායම
3. ආයෝජන ආදායම
4. වෙනත් ආදායම

යම් පුද්ගලයෙකු යම් ගෙවීමක් සඳහා සේවක සේවක සම්බන්ධතාවයක් මත සිදු කරන සේවා සැපයීම් **සේවා නියුක්ති ආදායම ලෙස සැලකිය හැකි** වේ.

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 5 වැනි වගන්තිය අනුව සහ අනෙකුත් වගන්ති අනුව සේවා නියුක්ති ආදායමට බදු ගණනයේදී ප්‍රමුඛතම අවස්ථාව හිමිව ඇත. එනම් බදු ගණනයේදී එය පළමුවෙන්ම සලකා බැලීම සිදු කළ යුතුව ඇත.

5 වැනි වගන්තිය අනුව,

තක්සේරු වර්ෂයක සඳහා යම් පුද්ගලයෙකුට සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම එම තක්සේරු වර්ෂය සඳහා එම පුද්ගලයාගේ සේවා නියුක්තියෙන් ලද ලැබීම් සහ ලාභ ලෙස සලකා බැලිය යුතු වේ.

පනතේ 195 වැනි වගන්තියේ "සේවා නියුක්තිය" යන්න නිර්වචනය කර ඇත.

(අ) (i) වෙනත් යම් තැනැත්තකුගේ සේවයෙහි යෙදී සිටින පුද්ගලයකුගේ තත්ත්වයඃ

(ii) යම් අස්ථිත්වයක (Entity) කළමනාකරු ලෙස යම් පුද්ගලයෙකුගේ තත්ත්වයඃ

(iii) ඉටු කරනු ලබන සේවාවන් සම්බන්ධයෙන් යම් ස්ථාවර හෝ නිශ්චිය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික සඳහා හිමිකම ලබාදෙන, යම් පුද්ගලයෙකුගේ තත්වයඃ

(iv) යම් පුද්ගලයකු විසින් දරන යම් රජයේ ධූරයක්ඃ

(v) සේවායෝජකයකුගෙන් හෝ සේවායෝජකයකු වෙතින් යම් ගෙවීමක් ලබන හෝ ලැබීමට ඇති හෝ සේවා නියුක්තයකු ලෙස හේ ඒ හා සමාන තත්ත්වයකින් වෙනත් යම් ප්‍රතිලා ලබන යම් පුද්ගලයකුගේ තත්වයඃ

(vi) යම් සංස්ථාවක හෝ සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස ඇති තත්ත්වය,

අදහස් වන අතර

(ආ) ඊට යම් **<u>අතීත, වර්තමාන</u>**, හෝ **<u>අනාගත</u>** සේවා නියුක්තියක් ද ඇතුළත් වේ.

මෙම නිර්වචනයට අනුව අතීත, වර්තමාන හෝ අපේක්ෂිත සේවා නියුක්තියද ඇතුලත් කල යුතුව ඇත.

අතීත සහ අපේක්ෂිත සේවා නියුක්තිය පහත උදාහරණවලින් පැහැදිලි කර ඇත.

2.1.1 අතීත සේවා නියුක්ති ආදායම

විදුර මහතා ඉංජිනේරුවරයෙකු වන අතර වසර 05 ක කාලයක් Y&Y ඉන්ඩස්ට්‍රීස් ආයතනයේ සේවය කර ඉන් ඉවත් වී ජපානයට අයත් ගොඩනැගිලි ඉදිකිරීම් සමාගමේ ශ්‍රී ලංකාවේ ශාඛාවේ ප්‍රධාන ඉංජිනේරුවරයා ලෙස කටයුතු කරයි. පෙර ආයතනය සමඟ තවමත් සුහඳ සම්බන්ධතා පවත්වාගෙන යන අතර එම ආයතනයට අදාල කාර්මික කටයුතු වලට අදාලව ලැබෙන ව්‍යාපාරික අවස්ථා Y&Y ආයතනයට ලබා දීමට කටයුතු දීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව විදුර මහතාට එම ගනුදෙණුවල වටිනාකමින් 5% මුදලක් ලබා දීමට Y&Y ආයතනය කටයුතු කරයි.

මෙම ලැබීම් විදුර මහතාගේ අතීත සේවා නියුක්තියට අදාලව ඇතිවන වර්තමාන ලැබීමක් වන බැවින් එයද, සේවා නියුක්ති ආදායමට ගණනයේදී සලකා බැලිය යුතු වේ.

JMC vLearning

2.1.2 අපේක්ෂිත සේවා නියුක්ති ආදායම

කුමාරතුංග මහතා පළපුරුදු විකුණුම් කළමනාකරුවෙකු වන අතර වර්තමානයේදී ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ විකුණුම් කරනු ලබන ආයතනයක් විකුණුම් කළමනාකරු ලෙස සේවය කරනු ලබයි. එම සමාගම හා තරගකාරී ආයතනයක් විසින් කුමාරතුංග මහතාට සේවයට බැඳීමට ආරාධනාවක් ලැබුනද එයට එකඟ නොවීය. එම මහතා එකඟ කර ගැනීම සඳහා, සිය පවුල සඳහා විදේශ සංචාරයක් ලබා දෙන ලද අතර ඒ සඳහා එම ආරාධිත සමාගම රු. 2,000,000 පමණ වැය කර ඇත. ඉන්පසුව මා 04 ට පමණ පසුව ආරාධනාව පිළිගැනීමට එකඟ විය. නමුත් වෙළඳපොල තුල ඇති වූ වෙනස්කම් හේතුවෙන් කුමාරතුංග මහතා බඳවා ගැනීම සිදු නොකිරීම එම ආරාධිත ආයතනය තීරණය කළ අතර, කුමාරතුංග මහතා පෙර සමාගම සමඟ සේවයේ නිරත වී සිටී.

එම රු. 2,000,000 වටිනාකමින් යුත් විදේශ සංචාරය සඳහා දරන ලද වියදම අපේක්ෂිත සේවා නියුක්තිය වෙනුවෙන් ලද ලැබීමක් ලෙස සලකා බද්දට යටත් විය යුතු වේ.

පනතේ 195 වැනි වගන්තිය අනුව "සේවා නියුක්තිය" යන්නෙන් යම් සේවා නියුක්තියක නිරත යම් පුද්ගලයෙකු අදහස් වේ.

පනතේ 195 වැනි වගන්තිය අනුව "සේවායෝජකයා", යන්නෙන්,

යම් සේවා නියුක්තයකු සේවා නියුක්තියෙහි නිරත කරවන හෝ ඔහු වෙත වැටුප් ගෙවනු ලබන හෝ කලින් සේවා නියුක්තයකුව සිටි සේවා නියුක්තයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට එම සේවා නියුක්තයාගේ පූර්වා සේවා සඳහා යම් විශ්‍රාම වැටුපක් හෝ වෙනත් යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලබන, යම් තැනැත්තෙකු අදහස් වේ. මෙහි පහත අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති තැනැත්තා ඇතුළත් වේ.

අස්ථිත්වයක්	තැනැත්තා
සමාගමක් හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක්	ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා, කළමනාකරු හෝ වෙනත් ප්‍රධාන නිළධාරියා
හවුල් ව්‍යාපාරයක්	ප්‍රමුඛ හවුල්කරු හෝ ශ්‍රී ලංකාව තුළ වාසිකව සිටින යම් ක්‍රියාකාරී හවුල්කරුවෙකු, සහ කිසිදු ක්‍රියාකාරී හවුල්කරුවකු ශ්‍රී ලංකාව තුළ වාසිකව නොසිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ සිටින අනුයෝජිතයා
භාරයක්	භාරයේ භාරකරු හෝ භාරකරුවන්

JMC vLearning

නිර්වාසික තැනැත්තෙකු	ඒ තැනැත්තාගේ ශ්‍රී ලංකාවේ සිටින අනුයෝජිතයා හෝ ඇටෝර්නි බලකරු
රජයේ ආයතනයක්	ගණකාධිකාරීවරයා හෝ මූල්‍ය අධ්‍යක්ෂවරයා හෝ පරිපාලන නිළධාරියා හෝ දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියා හෝ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ කොමිෂන් සභාවේ හෝ කමිටුවේ සභාපතිවරයා හෝ පාරිශ්‍රමිකය ගෙවන වෙනත් යම් තැනැත්තෙකු:

2.2 බද්දට යටත් කිරීමේ පදනම

දේශීය යටත් පනතේ 21 වැනි වගන්තිය අනුව යම් පුද්ගලයෙකු විසින් සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම ගණනයේදී එම පුද්ගලයා විසින් ආදායම් බදු ගණනය කිරීමේ වාරික සඳහා **"මුදල් පදනම"** මත සලකා බැලිය යුතු වේ.

පනතේ 22 වැනි වගන්තිය අනුව මුදල් පදනම මත ගිණුම් තැබීම යනු,

(a) යම් තැනැත්තෙකුට ගෙවීමක් ලැබුණු විට හෝ ගෙවීමක් ලැබීමට සැලැසු වූ විට එම තැනැත්තා එම මුදල උපයා ගැනීමක් ලෙසත්,

(b) යම් තැනැත්තෙකු විසින් යම් වියදමක් හෝ වෙනත් මුදලක් ගෙවනු ලැබූ විට එම තැනැත්තා එය වැය කරනු ලැබූ ලෙස සැලකීම වේ.

2.2.1 මුදල් පදනම යටතේ ආදායම් හඳුනා ගැනීම

සංඛ මහතා විදුලක නිෂ්පාදකගේ සමාගමේ නිෂ්පාදන කළමනාකරු ලෙස සේවයේ නිරත වී සිටි අතර 2025/2026 තක්සේරු වර්ෂයට ලාභයට අදාළ ප්‍රසාද දීමනාව 2023 අප්‍රේල් 10 වෙනි දින ගෙවීම සිදු කරන ලදී.

මුදල් පදනමට අනුව ආදායම ලද දිනයට අනුව බදු සඳහා සලකා බැලිය යුතු බැවින් 2023/2024 තක්සේරු වර්ෂයට අදාලව සංඛ මහතාගේ සේවා නියුක්ති ආදායමක් ලෙස බදු ගණනය සඳහා සලකා බැලිය යුතු වේ.

JMC vLearning

තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයෙකුට සේවා නියුක්තියෙන් ලැබෙන ලැබීම් සහ ලාභ ගණනය කිරීමේ දී එම තක්සේරු වර්ෂය තුළ දී ඒ පුද්ගලයාට ඒ සේවා නියුකිත්යෙන් ලැබුණු හෝ උපයන ලද පහත දැක්වෙන මුදල් ප්‍රමාණ ඇතුළත් කරනු ලැබිය යුතුය.

(අ) වැටුප්, පඩිනඩි, නිවාඩු පඩි, අතිකාල දීමනා, ගාස්තු, විශ්‍රාම වැටුප්, කොමිස් මුදල, පාරිතෝෂික, ප්‍රසාද දීමනා සහ වෙනත් සමාන ගෙවීම්;

(ආ) ජීවන වියදම් දීමනා, යැපීම් දීමනා, ගෙවල් කුලී, සංග්‍රහ වියදම් දීමනා හෝ ගමන් වියදම් දීමනා ඇතුළු පෞද්ගලික දීමනා ගෙවීම්;

(ඇ) යම් පුද්ගලයකු හෝ එම පුද්ගලයාගේ ආශ්‍රිත තැනැත්තෙකු (ඥාතියෙකු) විසින් දරන ලද වියදම් නිදහස් කිරීම හෝ ප්‍රතිපූර්ණය කිරීම සඳහා ගෙවනු ලබන වියදම්;

(ඈ) සේවා නියුක්ති කොන්දේසි වලට එකඟ වීම වෙනුවෙන් එම පුද්ගලයාට කරනු ලබන ගෙවීම්,

(ඉ) සේවා නියුක්තයන් අතිරික්ත වීම හෝ සේවා නියුක්තිය අහිමි වීම හෝ සේවා නියුක්තිය උවසන් කිරිම නිසා කරනු ලබන ගෙවීම්;

(ඊ) සේවා නියුක්තයා වෙනුවෙන් විශ්‍රාම අරමුදලකට ගෙවන ලද විශ්‍රාම දායක මුදල් සහ සේවා නියුක්තිකයා සම්බන්ධයෙන් විශ්‍රාම යාමේදී ලැබෙන මුදල්;

(උ) යම් පුද්ගලයකුගේ හෝ එම පුද්ගලයාගේ ආශ්‍රිත තැනැත්තකුගේ ප්‍රතිලාභය උදෙසා වෙනත් තැනැත්තකුට කරනු ලබන ගෙවීම් හෝ පැවරීම;

(ඌ) යම් පුද්ගලයකු විසින් හෝ එම පුද්ගලයාගේ ආශ්‍රිත තැනැත්තෙකු විසින් සේවා නියුක්තිය ප්‍රකාරව ලබාගත් හෝ උපයාගත් ප්‍රතිලාභවල සාධාරණ වෙළඳපල වටිනාකම;

(එ) සේවා නියුක්තිය සම්බන්ධයෙන් ලද ත්‍යාග ඇතුළු වෙනත් ගෙවීම්:

(ඒ) සේවා නියුක්තිකයන් සඳහා වු කොටස් යෝජනා ක්‍රමයක් යටතේ විභජනය කරන ලද කොටස්වල වෙළඳපොල වටිනාකමින් සේවා නියුක්තියාගේ දායක මුදල ඉවත් කළ විට ලැබෙන මුදල.

JMC vLearning

2.3 සේවා නියුක්ති ආදායම ගණනයේදී ඉවත් කළ යුතු ලැබීම් හා ලාභ

පනතේ 5(3) වැනි වගන්තිය අනුව,

යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් **පුද්ගලයෙකුට** සේවා නියුක්තියෙන් ලැබෙන ලැබීම් සහ ලාභ ගණනය කිරීමේදී පහත දැක්වෙන දෑ බැහැර කරනු ලැබිය යුතුය.

a) නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ සහ අවසාන රඳවා ගැනීමේ ගෙවීම්;

b) සේවායෝජකයා වෙනුවෙන් ඒ පුද්ගලයා විසින් දරන ලද වියදම් නිදහස් කිරීම හෝ ප්‍රතිපූර්ණය කිරීම;

c) (සියලු පූර්ණ කාලීන සේවා නියුක්තයන්ට සමාන කොන්දේසි මත ප්‍රතිලාභ අත්වන අවස්ථාවක දී, එම පුද්ගලයාගේ දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය හෝ සෞඛ්‍ය රක්‍ෂණ වියදම් නිදහස් කිරීම හෝ ප්‍රතිපූර්ණය කිරීම;

d) ප්‍රමාණය, වර්ගය සහ වාර ගණන අනුව, සේවා යෝජකයා විසින් ගිණුම් පෙන්වීම හෝ අදාළ පුද්ගලයාට වෙන් කිරීම අසාධාරණ හෝ පරිපාලනමය වශයෙන් ප්‍රායෝගික නොවීම හේතු කොටගෙන, විශේෂ සැලකිල්ලක් නොදැක්වීමේ පදනම මත සේවා නියුක්තයන්ට කරනු ලබන ගෙවීම් හෝ උපචිත වන ප්‍රතිලාභ;

e) සේවා නියුක්තයන් උදෙසා වූ කොටස් යෝජනා ක්‍රමයක් යටතේ, සේවා නියුක්තයකුට ප්‍රදානය කර ඇති කොටස් අත්කර ගැනීමේ අයිතිවාසිකමක වටිනාකම හෝ අත්කර ගැනීමට මනාපය පළ කිරීමට ඉඩ දී ඇති කොටස්වල අදාළ අවස්ථාවේ වටිනාකම; සහ

f) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද විශ්‍රාම වැටුප්, අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ අරමුදලක හෝ අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ සමිතියක සේවා නියුක්තිකයාගේ ගිණුමට සේවා යෝජකයා විසින් ගෙවනු ලබන දායක මුදල්.

2.3.1 බදු නිදහස් සේවා නියුක්ති ආදායම් (3 වන උපලේඛනයේ සඳහන් පරිදි)

a) යම් තැනැත්තෙකුට සිදු වූ පෞද්ගලික හානියක් හෝ මරණයක් වෙනුවෙන් ගෙවනු ලබන වන්දි හෝ පාරිතෝෂිකය.

b) දේශීය ආදායම් කොමසාරිස්වරයා (CGIR) අනුමත කරන ලද අර්ථ සාධක අරමුදලකින් විශ්‍රාම යන
අවස්ථාවේදී සේවකයාට ගෙවනු ලබන මුදල් ප්‍රමාණය.

c) 1987 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව කාලයට අදාල විශ්‍රාම අරමුදලකින් හෝ සේවා නියුක්ති භාර අරමුදලකින් කරන ලද ආයෝජන මඟින් ලද ආයෝජන ආදායම් ලැබීම්.

JMCVLearning

d) ශ්‍රී ලංකා රජය හෝ රජයේ ආයතනයක් මඟින් රජයේ විශ්‍රාමිකයෙකුට විශ්‍රාම ආදායම් ලෙස ගෙවනු ලබනබප්‍රමාණය.

e) රජයේ සේවකයෙකුට ලැබෙන වාහන බලපත්‍රයකින් එකී සේවකයාට උද්ගතවන ප්‍රතිලාභය.

2.4 සේවා නියුක්ති ආදායමෙන් වියදම් අඩු කිරීම - වගන්තිය 10(01)

දේශීය ආදායම් පනතේ 10 වැනි වගනිත්ය අනුව සේවා නියුක්ති ආදායම ගණනයේදී කිසිදු වියදමක් අඩු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

2.4.1 වියදම් අඩු කිරීම ඉඩ නොදීම

විරාජ් මහතා ABC සමූහ ව්‍යාපාරයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස සේවය කරයි. ආයතනයට යෑමට සහ ඒමට තම මෝටර් රථය භාවිතා කරන අතර ඒ සඳහා කිසිදු දීමනාවක් ආයතනයෙන් හිමි නොවන බැවින් ආදායම් බදු සඳහා සේවා නියුක්ති ආදායම ගණනයේදී දරන ලද රු. 750,000/- වියදම අඩු කිරීමට ඉල්ලා ඇත.

10 වැනි වගන්තිය අනුව කිසිදු අඩු කිරීමකට ඉඩ දිය නොහැකි බැවින් දරන ලද මෙම වියදම බදු සඳහා ආදායම ගණනයේදී අඩු කළ නොහැකි වේ.

2.5 මූල්‍යමය නොවන ප්‍රතිලාභවල වටිනාකම තීරණය කිරීම_(Value of non-cash benefits)

සේවායෝජකයාගේ හෝ වෙනත් යම් පාර්ශවයකින් සේවා නියුක්තියට අදාලව ලැබෙන මූල්‍යමය නොවන ප්‍රතිලාභවල වටිනාකම අනුව බදු ගණනය සඳහා යොදා බැලිය යුතු වේ. එහිදී පහත සඳහන් අනුපිලිවෙල යොදා ගැනීම කළ යුතු වේ.

(1) එහි **වෙළඳපොල අගය** හඳුනා ගැනීම සිදු කිරීම.

(2) එලෙස වෙළඳපොල අගය තීරණය කළ නොහැකි නම්, දේශීය ආදායම් කොමසාරිස්වරයා හෝ අමාත්‍යවරයා විසින් නිශචිතව දක්වා ඇති ප්‍රතිලාභවල වටිනාකම යොදා ගන්න.

2017 අංක 24 දරණ පනතට අදාලව **<u>නිකුත් කළ නියෝගයේ සඳහන්</u>** පරිදි ප්‍රතිලාභවල වටිනාකම් පනත ලෙස හඳුනා ගැනීම සිදු කළ යුතු වේ.

JMC vLearning

2.5.1 කොටස් ප්‍රතිලාභයේ වටිනාකම

සේවකයෙකුට ලබා දෙන කොටස්වල වටිනාකම සේවායෝජකයා විසින් සේවකයන්ට කොටස් විභජනය කිරීමතක් හෝ කොටස් අත්පත් කර ගැනීමට වාරණයක් ලබා දී ඇති විට ඉන් ප්‍රතිලාභයක් ඇති වීමට එය නොමිලේ හෝ අඩු වටිනාකමට ලබා දීම සිදු කළ යුතු වේ.

එහිදී ප්‍රතිලාභය පහත ලෙස හඳුනා ගැනීම කළ යුතු වේ.

කොටස්වල ප්‍රතිලාභය	=	**කොටස්වල/කොටස් වරණවල වෙළඳපොල වටිනාකම**	-	**කොටස් /වරණ සඳහා සේවකයා දැරූ පිරිවැය**

උදාහරණය:-

විදුරංග මහතා සමාගමේ වසර 10 පමණ සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත සේවකයන් සඳහා කොටස් බෙදා හැරීමේ ක්‍රමයක් (ESOF) යටතේ සමාගමේ කොටස් 2,000 ක් හිමිකමක් ලද අතර එය ලබා ගැනීමට එක කොටසකට රු. 20 බැගින් ගෙවීමට සිදු විය. එදිනට එම කොටසක වෙළඳපොල වටිනාකම රු. 50 ලෙස තීරණය කරන ලදී. කොටස් හිමිකම ලැබීමෙන් විදුරංග මහතාට ලද සේවා නියුක්ති ප්‍රතිලාභය හඳුනා ගන්න.

2.5.2 නිවාස ප්‍රතිලාභය

- **සේවායෝජකයා විසින් සපයනු ලබන ඕනෑම නිවාසයක වටිනාකම (Value of any residence provided by the employer)**

  සේවායෝජකයා විසින් සපයනු ලබන ඕනෑම නේවාසික ස්ථානයක වටිනාකම ලෙස අවස්ථානුකූලව වෙළඳපොල වටිනාකම විය යුතුය.

  වෙළඳපොල වටිනාකම නිශ්චය කරගත නොහැකි අවස්ථාවන් වලදී පහත ලෙස එහි වටිනාකම තීරණය කළ යුතු වේ.

JMC vLearning

විස්තරය	මාසික මූල්‍ය නොවන ප්‍රතිලාභය (රු.)		
	වරිපනම් බදු වලට යටත් ප්‍රදේශ (In rated area)	වරිපනම් බදු වලට යටත් නොවන ප්‍රදේශ (In unrated area)	වතු බංගලා (Estate Bungalows)
සේවා යෝජකයා සපයන නිවාස	අදාළ මාසයේ වැටුපෙන් 12.5%	අදාළ මාසයේ වැටුපෙන් 10%	අදාළ මාසයේ වැටුපෙන් 7.5%

- **මෙහි වැටුප යනු : සේවක අර්ධසාධකයට යොදා ගන්නා වැටුප වේ.**

උදාහරණ:

සෝමසුන්දර මහතා ABC සමාගමේ විධායක අධ්‍යක්‍ෂකවරයෙක් ලෙස කටයුතු කරයි. ඔහුගේ මාසික වැටුප රු. 300,000 ක් වන අතර නේවාසික පහසුකම් සඳහා නිවසක් ලබා දී ඇත.

(a) එම නිවසේ මාසික කුලිය රු. 100,000 ක් ආයතනය විසින් ගෙවනු ලබයි නම් ප්‍රතිලාභය තීරණය කරන්න.

(b) මෙම නිවස ආයතනයට අයත් නිවසක් වේ නම් එය වරිපනම් බලප්‍රදේශයක පිහිටා ඇත්නම් ඇතිවන ප්‍රතිලාභය තීරණය කරන්න.

(c) මෙම නිවස ආයතනයට අයත් නිවසක් වේ නම් එය වරිපනම් බලප්‍රදේශයක පිහිටා ඇත්නම් සහ ආයතනයෙන් මසකට රු: 10,000 සේවකයාගේ වැටුපෙන් අඩුකර ගනී නම් ප්‍රතිලාභය.

- **සේවායෝජකයා විසින් යම් නිවසක් වෙනුවෙන් වියදම් ප්‍රතිපූර්ණයක් සිදු කර ඇත්නම් සත්‍ය වියදම ප්‍රතිලාභයේ වටිනාකම ලෙස සැලකිය යුතු ය.** - ඉහත සෝමසුන්දර මහතාගේ ගැටළුවෙහි (a) අවස්ථාව.

2.5.3 සේවායෝජකයා විසින් සපයනු ලබන ප්‍රවාහන පහසුකමක වටිනාකම අගය කිරීම. (Value of transport facilities provided by the employer)

සේවා යෝජකයා විසින් සේවකයෙකුට යම්කිසි මෝටර් රථයක (Motor Vehicle) පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන ලෙස පෞද්ගලික භාවිතය සඳහා ලබා දී ඇති විට, එම ප්‍රතිලාභයේ

JMCVLearning

වෙළඳපොල වටිනාකම බද්දට යටත් විය යුතු අතර, එලෙස වෙළඳපොල වටිනාකම ගණනය කළ නොහැකි නම්, ප්‍රතිලාභයේ වටිනාකම පහත පරිදි ගණනය කළ යුතුය.

වාහන වර්ගය	මාසික මූල්‍ය නොවන ප්‍රතිලාභයේ වටිනාකම (රු.)		
	වාහනය (Vehicle)	රියදුරු (Driver)	ඉන්ධන (Fuel)
• ඕනෑම වර්ගයක්	20,000	10,000	20,000

එක් සේවකයෙකුට නිල හෝ පෞද්ගලික භාවිතය සඳහා එක් වාහනයකට වඩා වැඩි ප්‍රමාණයක් සපයන ලැබූ විට එක් වාහනයක් පමණක් පෞද්ගලික පරිහරණය සඳහා ලබා දුන් ලෙස සලකා උපයන විට ගෙවීම් බදු ගණනය කළ යුතුය.

- **සේවායෝජකයෙකු විසින් සේවකයෙකුට පූර්ණ හෝ අර්ධ වශයෙන් පෞද්ගලික භාවිතය සඳහා මෝටර් බයිසිකලයක් ලබා දී ඇති විට එම ප්‍රතිලාභයේ වටිනාකම,**

එන්ජින් ධාරිතාව නොසලකා,

a) ඉන්ධන සහිතව ලබා දී ඇති විට මසකට රු. 5,000 වටිනාකමක් ද,

b) ඉන්ධන රහිතව ලබා දී ඇති විට මසකට රු. 3,000 වටිනාකමක් ද,

ප්‍රතිලාභයේ වටිනාකම ලෙස සැලකිය යුතුය.

- **සේවායෝජකයා විසින් විධිමත් ධාවන වාර්තා පවත්වාගෙන යන විට සේවා නියුක්තිකයෙකුට පුද්ගලික භාවිතයෙන් ලැබෙන ප්‍රතිලාභවල වටිනාකම එන්ජින් ධාරිතාව නොසලකා,**

a) මෝටර් රථයක් සඳහා කිලෝමීටරයකට රු. 25 කි. උපරිමය මසකට රු. 20,000.

b) මෝටර් බයිසිකලයක් සඳහා කිලෝමීටරයකට රු. 5 කි.

- **සේවායෝජකයා විසින් සේවා නියුක්තිකටයකුට හිමි ඕනෑම මෝටර් රථයක් හෝ මෝටර් බයිසිකලයක් වෙනුවෙන් දරනු ලබන හෝ ප්‍රතිපූර්ණය කරනු ලබන ඉන්ධන හෝ නඩත්තු වියදම්වල සත්‍ය වටිනාකම සේවා නියුක්තිකයාගේ ප්‍රතිලාභය ලෙස සැලකිය යුතුය.**

- **රජය විසින් නිකුත් කළ චක්‍ර ලේඛයක්, විධිවිධානයක් හෝ රෙගුලාසියක් යටතේ එකී සේවකයාගේ නිල භාවිතය සඳහා වාහනයක් හෝ ඉන්ධන දීමනාවක් ලබා දී ඇති විට,**

  - වාහනයට ⟶ සේවායෝජක දැරූ පිරිවැයෙන් 25%
  - ඉන්ධන දීමනාවෙන් 25% (මෙය එක් වාහනයකට පමණක් අදාල වේ)

JMC Learning

2.5.4 සේවායෝජකයා විසින් සපයනු ලබන අනෙකුත් ප්‍රතිලාභ, අනෙකුත් ප්‍රතිලාභ සැපයීමක් වේ නම්, ඒවා දී ඇති කොන්දේසීන්ට යටත්ව තීරණය කළ යුතු වේ.

ප්‍රතිලාභයේ ස්වභාවය	ප්‍රතිලාභ වටිනාකම
ප්‍රවාසිකයන් (expatriates) හට සපයන හෝටල් පහසුකම්	100% පිරිවැය
සහනදායී අනුපාතයක් යටතේ ලබාදෙන ණය	0% පිරිවැය
සේවකයන් ආදිය සැපයීම	100% පිරිවැය
විදුලිය, ගෑස් ආදිය සැපයීම	100% පිරිවැය
වෛද්‍ය ප්‍රතිලාභ සැපයීම	වෛද්‍ය බිල්පතින් 100%
නොමිලයේ සපයන ආහාර	100% පිරිවැය
දන්ත වෛද්‍ය, සෞඛ්‍ය හෝ රක්ෂණ වියදම් ගෙවීම් පූර්ණකාලීන සේවකයින්ට සමාන කොන්දේසි නොමැති තත්ත්වයක් මත ගෙවා ඇති විට	100% පිරිවැය
දුරකථන බිල්පත් ගෙවීම	**50% පිරිවැය**
රාජකාරී කටයුතු සඳහා නොවන කටයුතු සඳහා ලබාදෙන ගුවන් ටිකට්පත්	100% පිරිවැය
බදු ගෙවීම	ගෙවූ බදු මුදල

- ''සමාන කොන්දේසි'' යනුවෙන් එක් ශ්‍රේණියක සිටින සියළු සේවකයන්ට වෙනස් කොට සැලකීමකින් තොරව සමානව අදාල වීම අදහස් වේ.

2.5.5 රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනයක්, නියෝගයක් හෝ රෙගුලාසියක් යටතේ සංනිවේදන පහසුකම් සඳහා සේවායෝජකයා දරන පිරිවැයෙන් 25% සේවකයාගේ ප්‍රතිලාභයක් ලෙස ගත යුතු වේ.

JMC vLearning

2.6 සේවා නියුක්ති විශ්‍රාම ප්‍රතිලාභ (Terminal Benefits)

සේවා නියුක්තිකයෝ විශ්‍රාම ගැනීමකදී හෝ රැකියාව අහිමි වීමකදී ලද ප්‍රතිලාභයන් එකවර ලැබීම් ලෙස බදු ගණනයේදී ඇතුලත් කල යුතු වේ.

විශ්‍රාම ප්‍රතිලාභයන් යන්නට පහත දෑ ඇතුලත් වේ.

1. විශ්‍රාම පාරිතෝෂික
2. සංයුක්ත විශ්‍රාම වැටුප්
3. සේවක භාරකාර අරමුදලින් ලැබීම්
4. සේවක අර්ථසාධක අරමුදලින් ලැබීම් (පරිපාලන / අනුමත)
5. සේවක අහිමි වීම සඳහා වන්දි ලැබීම්

සේවකයන්ට ඒකාකාරීව අදාල වන ලෙස යම් ක්‍රමවේදහක් අනුගමනය කරමින් සේවක වන්දි ගෙවීමක් සිදු කරයි නම්, සහනදායී බදු අනුපාත යටතේ බද්දට යටත් වන අතර එසේ නොවේ නම්, සමාන්‍ය බදු අනුපාතයන් යටතේ බද්දට යටත් විය යුතු වේ.

2.7 මූලික සේවා නියුක්තිය

යම් පුද්ගලයෙක් සේවා නියුක්තිකයන් කිහිපයක් සිදු කරන අවස්ථාවන්හිදී මූලික සේවා නියුක්තිය හඳුනා ගැනීම සඳහා මූලික සේවා නියුක්ති ප්‍රකාශයක් ලබා දිම සිදු කළ යුතු වේ. යම් පුද්ගලයෙකු සඳහා එක් මූලික සේවා නියුක්තියක් පමණක් තිබිය හැකි අතර ලබා දෙන ලද ප්‍රකාශය සේවකයා ඉවත් කර ගන්නා තෙක් අදාල ලබා දී ඇති ප්‍රකාශනය වලංගු වන අතරම එසේ ප්‍රකාශනයක් සේවකයා විසින් ලබා දීමක් සිදු කර නොමැති නම් පනත අනුව සේවායෝජකයා විසින් ද්වීතියික සේවා නියුක්තියක් ලෙස සලකන බදු කිරීම කළ යුතු වේ.

2.8 ද්විතීයික සේවා නියුක්තිය

යම් සේවකයෙකු විසින් මූලික සේවා නියුක්ති ප්‍රකාශ ප්‍රකාශයක් නොලැබුණු සෑම අවස්ථාවකදීම සේවායෝජකයා විසින් අදාල සේවකයා ද්වීතික සේවා නියුක්තියක නිරත වන බව සලකමින් රඳවා ගැනීමේ බදු අඩු කිරීමේ කාර්යයන් සිදු කළ යුතු වේ. ඒ අනුව ද්විතික සේවා නියුක්තියකදී බදු අඩු කිරීම පහත ලෙස කළ යුතු වේ.

2.9 අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (Advance Personal Income Tax/ APIT)

2.9.1 2025.04.01 දිනට සිට ක්‍රියාත්මක වන පරිදි, මාසික දළ වැටුප රු. 150,000 හෝ තක්සේරු වසරකට රු. 1,800,000 ක් ඉක්මවන වැටුප සඳහා සේවායෝජකයා විසින් පුද්ගල ආදායම් අත්තිකාරම් බද්ද අඩු කළ හැකිය. මෙම යෝජනා ක්‍රමය ''පුද්ගල ආදායම් අත්තිකාරම් බද්ද (APIT) ලෙස හැඳින්වේ

මෙහි වැටුප යනු ලැබෙන මූල්‍යමය ප්‍රතිලාභයන්ගේ එකතුවයි.

JMC vLearning

2.9.2 දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයට අනුව පුද්ගල ආදායම් (අත්තිකාරම් බද්දෙහි වැදගත් කරුණු පහත දක්වේ)

- ආදයම් බදු ගෙවීමට බැදී සිටින සෑම සේවකයෙකුගෙන්ම, ඔහුගේ සේවා නියුක්ත ආදායමෙන් ආදායම් බදු අඩු කිරීම, ඔහුගේ පාරිශ්‍රමික ගෙවන අවස්ථාවේදී සෑම සේවායෝජකයෙකු විසින්ම කල යුතුය.

ඊට ආදල බදු වගු පහත පරිදි වේ.

ආදායම් වර්ගය	අදාල වගුව
• ප්‍රාථමික සේවානියුක්ත ප්‍රකාශන ලබා දී ඇති ශ්‍රී ලංකාවේ ඕනෑම වාසික සේවකයෙකුගේ හෝ පුරවැසියෙකු වන අනේවාසික සේවාකයෙකුගේ සේවා නියුක්තියෙන් උපයන නිත්‍ය ලාභ මත.	වගුව 01
• එකවර ගෙවීම් මත	වගුව 02
• එක්වරක් පමණක් කරන ගෙවීම් (සේවාන්ත ප්‍රතිලාභ මත) (සේවකයාගේ කැමැත්ත නොසලකා)	වගුව 03
• ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන අනේවාසික සේවකයෙකුට කරන ගෙවීම් මත (ඔවුන්ගේ කැමැත්ත නොසලකා)	වගුව 04
• යම් සේවකයෙකුගේ ප්‍රාථමික සේවා නියුක්තියෙන් උපයන මාසික නිත්‍ය ලාභ රු. 100,000 නොඉක්මවන නමුත් තක්සේරු වර්ෂයේ ඕනෑම මාසයක් දක්වා සමුච්චිත ලාභ රු. 300,000 ඉක්මවන වීම.	වගුව 05
• සේවායෝජකයා විසින් සේවකයාගේ බදු වගකීම ගෙවන විට හෝ ප්‍රතිපූර්ණය කරන විට.	වගුව 06
• ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශනය සපයා නැති සේවකයෙකුට හෝ එක් සේවා යෝජකයෙකුට වැඩි ගණනක් යටතේ සේවා නියුක්ති සේවකයෙකුට කරන ගෙවීම් මත.	වගුව 07
• විදේශීය සේවා යෝජකයෙකුගෙන් ලැබෙන රැකියා ආදායමෙන් බදු අඩු කිරීමේ අනුපාතය	වගුව 08

*** APIT සඳහා Sec/2022/E/04/S බලන්න.

JMC Learning

තුන්වන පරිච්ඡේදය
තක්සේරු වන ව්‍යාපාර ආදායම
(Assessable Business Income)

ඉගෙනුම් ඵල

මෙම පරිච්ඡේදය අවසානයේදී ඔබට,

- ව්‍යාපාර ආදායම් යටතට අයත් වන දායම් මූලාශ්‍ර හඳුනාගැනීමට
- තක්සේරුවන ව්‍යාපාර ආදායම් ගණනයේ දී අඩු කිරීමට ඉඩ නොදෙන වියදම් හඳුනාගැනීමටත්
- ක්සේරුවන ව්‍යාපාර ආදායම් ගණනයේදී විශේෂයෙන් අඩු කිරීමට ඉඩ දෙන වියදම් හා සම්බන්ධ සීමා හඳුනාගැනීමටත්
- තක්සේරුවන ව්‍යාපාර ආදායම් ගණනය කරන ආකාරය සම්බන්ධවත් මනා අවබෝධයක් ලබාගත හැක

3.1 හැඳින්වීම

පුද්ගලයෙකු ව්‍යාපාරයක නිරතවෙමින් ලැබෙන ආදායම මෙම ගණනය සඳහා යොදාගත යුතුය.

මෙහි ව්‍යාපාරය යනු, පනතේ 195 වගන්තියේ නිර්වචනයට අනුව "එම වැඩ පිළිවෙලෙහි කාලසීමාව කෙතරම් කෙටි වුවද යම් වෙළඳාමක්, වෘත්තියක්, රැකියාවක් හෝ ව්‍යාපාරික ස්වරූපයක් සහිත තනි වැඩ පිළිවෙලක් වන අතර එයට අතීත, වර්තමාන හෝ අනාගත යම් ව්‍යාපාරයක් ඇතුළත් වේ".

3.1.1 වෙළඳාමක් හඳුනා ගැනීමේදී සැලකිලිමත් විය යුතු සාධක

1. **විකුණන දේ**	- පෞද්ගලිකව භාවිතා කළ නොහැකි
2. **හිමිකාරීත්වයේ කාලසීමාව තිබේනම්**	- ඉතා කෙටි කාලසීමාවක් සඳහා වත්කම් හිමිකාරීත්වයේ එය අයෝජනයක් වෙනුවට වෙළඳාමක් ලෙස අදහස් කරයි.
3. **පුනරාවර්තනය**	- ගණුදෙනුව නැවත නැවත කිරීම වෙළඳාමක් ලෙස යෝජනා කරයි.
4. **අතිරේක කටයුතු**	- යම් වත්කමක් විකිණිය හැකි භාණ්ඩයක් බවට පත්කිරීමේ ක්‍රියාවලිය වෙළඳාමක් ලෙස අදහස් කරයි.
5. **අභිප්‍රේරණය**	- ලාභයක් හෝ ලාභයක් ලබා ගැනීමේ අරමුණෙන් වෙළඳාම් කිරීම අවශ්‍ය වේ.
6. **විකිණීමේ අභිප්‍රාය**	- වෙළඳාමකදී සාමාන්‍යයෙන් විකුණනු ලබන්නේ ලාභ ලබා ගැනීමේ අපේක්ෂාවෙන් මිලදී ගත් භාණ්ඩ වේ.

JMC vLearning

මෙම නිර්වචනයට යම් සේවා නියුක්තියක් ඇතුළත් නොවේ. (ඊට හේතුව වන්නේ ප්‍රමුඛතාවය මත (Dominent) සේවා නියුක්ති ආදායම දැනටමත් ගණනය කර ඇති නිසාවෙනි).

එමනිසා මෙම කොටසේදී අප සලකන බලන්නේ එවැනි ව්‍යාපාර කටයුත්තකින් ගණනය වන ලාභ සහ ආදායම් වේ.

ව්‍යාපාරයක් සිදු කරන තැනැත්තා තනි පුද්ගල, හවුල් හෝ සමාගමක් වශයෙන් ඔහු සිදු කරන එම කාර්යය මත ගිණුම් ක්‍රියාවලිය තුළ ආදායම් වියදම් ගලපා ලාභය හෝ අලාභය ගණනය කරයි.

- මෙම කටයුතු සඳහා පොදුවේ පිළිගත් ගිණුම්කරණ සංකල්ප භාවිතා කරන අතර එම සංකල්ප එලෙසින්ම බදුකරණය සඳහා ද පිලිගනී.

❖ එමනිසා මෙම ගණනය කිරීම් සඳහා **<u>උපචිත පදනම්</u>** (Accrual Basis) ගිණුම් ක්‍රමය යොදාගත යුතුය.

ගිණුම් ක්‍රියාවලිය තුළ ව්‍යාපාරයට අදාල ආදායම් සහ වියදම් හඳුනාගෙන ඇතත් බදුකරණ ක්‍රියාවලිය තුලදී ද ඇතුලත් විය යුතු **<u>ආදායම්</u>** සහ **<u>වියදම්</u>** ගැලපීම් පිළිබඳ දක්වා ඇත.

ඒ අනුව ගිණුම්කරණ ක්‍රියාවලිය තුල ගණනය කර ඇති ලාභය/(අලාභය) එලෙසම යොදාගෙන එම ලාභය/(අලාභය) බදු පනතේ සඳහන් නීතියට අනුකූල ද? නොවිද? යන්න සැසඳුමක් පිළියෙල කල යුතුය. එය පහත පරිදි වේ.

බදු පරමාර්ථ සඳහා සැපයුම් ප්‍රකාශය

විස්තරය	+	-
ගිණුම්කරණ අනුව		
ලාභය	xxx	
අලාභය		xxx
අඩු කල නොහැකි වියදම්	xxx	-
ව්‍යාපාරික නොවන ආදායම්		xxx
අඩු නොකළ අඩු කළ හැකි වියදම්	-	xxx
බැර නොවූ එකතු විය යුතු ආදායම්	xxx	-
	xxx	xxx
බදු සඳහා ගැලපූ ලාභය/(අලාභය)	xxx	

JMC vLearning

3.2 යම් තක්සේරු වර්ෂයක් තුල ව්‍යාපාරයක් පවත්වාගෙන යාමෙන් පුද්ගලයෙකු ලබන ලාභ සහ ලැබීම් ගණනය කිරීමේදී පහත සඳහන් දෑ ඇතුලත් කළ යුතුය.

- සේවා ගාස්තු
- වෙළඳ තොගය (විකුණුම්)
- ව්‍යාපාරයක ප්‍රාග්ධන වත්කම් හෝ වගකීම් උපලබ්ධි ලාභ
- ව්‍යාපාරයක ක්ෂය කළ හැකි වත්කම් උපලබ්ධි ලාභ
- ව්‍යාපාරය පවත්වා ගැනීමට හෝ නැවැත් වීමට ලැබූ මුදල්
- ව්‍යාපාරය මත ලැබූ ත්‍යාග
- ව්‍යාපාරයට අනුයෝජිත වූ වෙනත් ආදායම් ඇතුළු දෑ අයිති වේ.

එම ආදායම් ගිණුම්කරණ ක්‍රියාවලියේදී හඳුනාගෙන ඇත්නම් නැවත ගැලපීමක් අවශ්‍ය නොවේ. නමුත් ඒවා නිසිපරිදි ආගණනය කර නොමැති නම් නිවැරදිව ගණනය කර ඇතුලත් කල යුතුය.

3.3 ව්‍යාපාරය හා ඵලදායිව සම්බන්ධ වී ඇති ආදායම්

3.3.1 ප්‍රශ්නය

ව්‍යාපාර සමඟ ඵලදායී ලෙස සම්බන්ධ වී ඇතැයි යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

3.3.2 පිළිතුර

ව්‍යාපාර සමඟ ඇතිවන යම් ආකාරයක බැඳියාවක්, ආශ්‍රිත කටයුත්තක් හෝ සම්බන්ධයක් ඉන් අදහස් වේ. එමනිසා එය ව්‍යාපාර ආදායම්වලින් ඇති වූවක් ලෙස සැලකේ.

3.3.3 උදාහරණ

නිෂ්පාදන සමාගමක් සම්බන්ධයෙන් සැලකීමේදී, අමතර ගබඩා ඉඩකඩ කෙටි කාලයක් සඳහා කුලියට දුන්නේ නම් එයින් උපයනු ලබන කුලී ආදායම ව්‍යාපාර කටයුතුවලට ඵලදායී ලෙස සම්බන්ධ වන අතර එම කුලී ආදායම ව්‍යාපාර ආදායමක් ලෙස සැලකේ.

3.4 ව්‍යාපාර ලැබීම් සහ ලාභ ගණනය කිරීමේදී පහත සඳහන් බැහැර කරනු ලැබිය යුතුය.

(a) නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ සහ අවසාන රඳවා ගැනීමේ ලැබීම්

(b) යම් තැනැත්තෙකුට සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම ගණනය කිරීමේදී ඇතුළත් කරනු ලබන මුදල් ප්‍රමාණයන්.

JMCvLearning

3.5 වියදම් අඩු කිරීම්

දේශීය ආදායම් පනතේ අඩු කිරීම් සියළුම ආදායම් ප්‍රභවයන්ට අදාළව සාකච්ඡා කරන අතර, සාමාන්‍යයෙන් අඩු කිරීම් ප්‍රධාන කාණ්ඩ තුනකට අයත් වේ.

- සාමාන්‍ය අඩු කිරීම් (10 වැනි වගන්තිය)
- ප්‍රධාන අඩු කිරීම් (11 වැනි වගන්තිය)
- විශේෂිත අඩු කිරීම් (12 - 19 සහ 24 වැනි වගන්තිය)

එමෙන්ම ව්‍යාපාර ආදායම් ගණනයේදී ඊට අදාල වියදම් නිසිපරිදි අඩු කර ඇත්නම් වෙනත් ගැලපීමක් අවශ්‍ය නොවන අතර වියදම් අඩුකිරීම් පිලිබඳ නියමයන් පනතේ 10, 11, 12, 13, 14, 15,15(A) 16, 17, 18, 19 සහ 24 වන වගන්තීන්හි විස්තරාත්මකව දක්වා ඇත.

- එම වගන්ති මඟින් ඉඩ නොදෙන වියදමක් හෝ ප්‍රමාණයක් අදාල පරිදි නැවත ගැලපිය (එකතු) යුතු අතර
- එම වගන්ති මඟින් ඉඩදෙන අතිරේක වියදම් බදු ගැලපුම් වලදී අඩු කළ යුතු වේ.

එමනිසා මෙම වගන්ති මඟින් දක්වා ඇති නියමයන් මොනවාද යන්න වටහා ගැනීම වැදගත් වේ.

3.5.1. සාමාන්‍ය අඩු කිරීම්

<u>10 වන වගන්තිය (අඩු කිරීමට ඉඩ නොදෙන වියදම්)</u>

මෙම වගන්තිය තුල ආදායම ඉපැයීමට අදාල නොවන පහත වියදම් ඉඩ නොදේ. එවැනි වියදම් වෙතොත් ඒවා නැවත ගලපන්න. ඒවානම්,

i. තැනැත්තෙකුගේ ගෘහස්ථ වියදම් - රාජපක්ෂ එදි දේශීය ආදායම් නඩුව
ii. මෙම පනත මඟින් අය කරනු ලබන ආදායම් බදු හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතවම දක්වා ඇති බදු (ESC, FS, VAT)
iii. ලිඛිත නීතියක් කඩ කිරීම මත රජයකට හෝ දේශපාලන උප බෙදීමකට ගෙවන දණ්ඩන සහ දඩ මුදල් (Fines and Penalties)
iv. නිදහස් කරන ලද මුදල් හෝ අවසන් රඳවා ගැනීමේ ගෙවීම් ඉපැයීමට දැරූ වියදම්
v. සේවා නියුක්ති ආදායම ගණනය කිරීමේදී ඇතුලත් නොවූ නමුත් සේවායෝජක ගෙවූ යම් ගෙවීමක්
vi. අනුමත නොවූ විශ්‍රාම, අර්ථ සාධක හෝ ඉතිරි කිරීමේ අරමුදල් සඳහා කල ගෙවීම්
vii. සංග්‍රහ කටයුතු සඳහා වෙන් කරන ලද හෝ දරන ලද වියදම්
viii. මේ දක්වා දරා නොමැති අනාගත වියදමක් වෙනුවෙන් ගිණුම් වලින් සංචිත වලට මාරු කිරීම් (වෙන්කිරීම්)
ix. සූදු, ඔට්ටු ලොතරැයි සඳහා දරන ලද වියදම් (එවැනි ව්‍යාපාර හැර)
x. කොමසාරිස්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති බදු හෝ වෙනත් අය කිරීම්
xi. රඳවාගත් බදු අඩු කළ යුතු ගෙවීමකින් එම රඳවාගත් බදු අඩු කර නොමැති විට එම වියදම

JMC Learning

ගෘහස්ථ වියදම් (වගන්තිය 197)

යම් පුද්ගලයෙකු තමා සම්බන්ධයෙන් වියදම් දරන අවස්ථාවකදී, එම වියදම්,

- වාසස්ථාන මෙන්ම ආහාරවේල්, පාන වර්ග, විනෝදාස්වාදය හෝ වෙනත් විවේකකාල ක්‍රියාකාරකම් සපයාදීම ඇතුලුව පුද්ගලයා නඩත්තු කිරීමේදී.
- එම පුද්ගලයා යාම් ඒම් නිවසේ සිට සිදු කරන විට ගමනාගමන වියදම.
- රැකියා ස්ථානයෙන් පිටත පැළඳීම සඳහා සුදුසු නොවන වස්ත්‍ර හැරුණු විට, පාවහන් ද ඇතුළුව එම පුද්ගලයා වස්ත්‍ර මිලදී ගැනීමේදී.
- එම පුද්ගලයා විසින් පවත්වනු ලබන ව්‍යාපාරයකට ඍජුව අදාළ වන්නා වූ උපාධියක් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් නොවන අධ්‍යාපනයක් හැර එම පුද්ගලයාට අධ්‍යාපනය ලබා දීමේදී හෝ
- එම පුද්ගලයෙකුගේ ණය කාඩ්පත් ණය ඇතුලුව ඔහුගේ පුද්ගලික ණය ගෙවීමේදී දරණතාක් දුරට ගෘහස්ථ වියදම්.

යම් පුද්ගලයෙකුට ගෙවීමක් කිරීමේදී හෝ වෙනත් අර්ථලාභයක් සැපයීමේදී වෙනත් තැනැත්තෙකු වියදම් දරන අවස්ථාවකදී, පහත අවස්ථා හැරුණු විට එම වියදම ගෘහස්ථ වියදමක් ලෙස සලකයි.

- එම පුද්ගලයාගේ ආදායම ගණනය කිරීමේදී කිරීමේදී එහ ගෙවීම හෝ අර්ථලාභය ඇතුලත් කරනු ලබන තාක් දුරට
- එම ගෙවීම හෝ අර්ථලාභය සඳහා සමාන වෙළඳපොල වටිනාකම ප්‍රතිශ්ඨාවක් එම පුද්ගලයා සපයා දෙනතාක් දුරට
- වියදම් කරන ලද මුදල් ප්‍රමාණය ඒ සඳහා ගිණුම් පෙන්වීම අසාධාරණ හෝ පරිපාලනමය වශයෙන් ප්‍රයෝගික නොවන විට

3.5.2. 11 වන වගන්තිය (ප්‍රධාන අඩු කිරීම්)

මෙහිදී වියදමක් අඩු කිරීමට කොන්දේසි තුනක් සැපිරිය යුතුය. මෙම කොන්දේසි ආයෝජන ආදායම් සඳහා ද අදාළ වේ. එනම්,

i. එම ව්‍යාපාරය සඳහා දැරූ

ii. ආදායම් ඉපයීම සඳහා දැරූ

iii. අදාළ තක්සේරු වර්ෂය තුල දරන ලද

නමුත් වෙනත් වගන්තියකින් ඉඩ දී නොමැති නම් ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් අඩු කළ නොහැක.

ප්‍රාග්ධන ස්වභාවයේ වියදමක් යනු- යම් වියදමක ප්‍රතිලාභය මාස දොළහකට වැඩි කාලයක් ලැබේ නම් එවැනි වියදම් ප්‍රාග්ධන වියදම් වෙයි.

JMCvLearning

3.5.3. විශේෂිත අඩු කිරීම්

- පොලී වියදම් - (12 වගන්තිය)
- වෙළඳ තොග සඳහා දීමනාව (13 වගන්තිය)
- අලුත්වැඩියා, කිරීම් හා වැඩි දියුණු කිරීම් (14 වන වගන්තිය)
- පර්යේෂණ හා සංවර්ධන වියදම් සහ කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීමේ වියදම් (15 වගන්තිය)
- අලෙවිකරණ සහ සන්නිවේදන වියදම් (15 A)
- ප්‍රාග්ධන දීමනා හා තුලනය කිරීමේ දීමනාව (16 වගන්තිය)
- ව්‍යාපාර දීමනා හා බැරකම් උපලබ්ධි කිරීමේදී සිදුවන පාඩු (17 වගන්තිය)
- මූල්‍ය පිරිවැයෙහි අඩු කළ හැකි මුදල (18 වගන්තිය)
- ව්‍යාපාර හෝ ආයෝජන පාඩු (19 වගන්තිය)
- බොල්ණය වියදම (24 වගන්තිය)

❖ **12 වන වගන්තිය - පොලී වියදම්**

මෙම වගන්තිය තුල ව්‍යාපාරයේ ආදායම් ඉපැයීමට හෝ ආදායම් ඉපැයීමට වත්කම් මිලදී ගැනීමකට ගත් ණය මත පොලී අඩු කළ හැකි බව දක්වා ඇත. (මේ සමඟ 18 වන වගන්තියද සලකා බැලිය යුතුය.) තුනී ප්‍රාග්ධණීකරන රීතිය.

❖ **13 වන වගන්තිය - වෙළඳ තොග සඳහා වියදම්**

වෙළඳ තොගය පිළිබඳව අදාල ගිණුම් ප්‍රමිතියේ සඳහන් කරුණු මෙම වගන්තිය මගින් පහත පරිදි ස්ථාපනය කර ඇත. එනම් පහත තොග වියදම් ඉඩ දෙනු ලැබේ.

✓	ආරම්භ වෙළඳ තොගයේ වටිනාකම	xxx
	සහ	
✓	වසර තුල එම වෙළඳ තොගයට ඇතුලත් විය යුතු වටිනාකම (ගැණුම්)	xxx
		xxx
✓	එම අගයෙන් වසර අග වෙළඳ තොගයේ අගය	(xx)
	වෙළඳ තොග භාවිතය (විකුණුම් පිරිවැය)	xxx

JMC vLearning

''වෙළඳ තොග'' යන්නෙන් යම් තැනැත්තෙකුගේ ව්‍යාපාරයක සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී විකුණනු ලබන හෝ විකිණීමට අපේක්ෂා කරනු ලබන එම තැනැත්තා සතු වත්කම්, එම වත්කම් මත කෙරීගෙන යන කාර්යය එම වත්කම් වලට, අන්තර්ගත කළ හැකි යම් ද්‍රව්‍ය පිළිබඳ තොග සහ පරිභෝජනය කල හැකි ද්‍රව්‍ය ඇති ගබඩා අදහස් වේ. (195 වගන්තිය)

''ප්‍රාග්ධන වත්කම්'' සහ **''ක්‍ෂය කළ හැකි වත්කම්''** වෙළඳ තොග යන නිර්වචනයට අයත් නොවේ.

- **14 වන වගන්තිය - අළුත් වැඩියා සහ වැඩි දියුණු කිරීම්**

මෙහිදී අදාළ අළුත්වැඩියා හෝ වැඩි දියුණු කිරීම් වියදම් ක්‍ෂය වන වත්කමක් සම්බන්ධයෙන් දරා ඇති විට ඒවා අයභාර හෝ **ප්‍රාග්ධන** ස්වභාවයේ වුවද පහත පිරිවැය යටතට ඉඩ දෙනු ලැබේ.

වැඩි දියුණු කිරීම් යන්නට ක්‍ෂය කල හැකි වත්කමේ තාවකාලික වැඩිවන ආකාරයේ අලුත්වැඩියා හා වැඩි දියුණු කිරීම් අදාල නොවේ.

''වැඩිදියුණු කිරීම'', යන්නෙන් අදහස් වන්නේ, ක්ෂය වන වත්කමක වටිනාකම ඉහළ නංවන අයුරින් ඊට එකතු කිරීම් හෝ වෙනස්කම් සිදු කිරීම සඳහා යම් පුද්ගලයෙකු විසින් දරනු ලබන වියදමයි; එහෙත්, ක්ෂය වන වත්කමක වටිනාකම තාවකාලිකව ඉහළ නංවන එම වත්කම නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා දරනු ලබන වියදම් ඊට ඇතුළත් නොවේ.

වැඩිදියුණු කිරීමේ පිරිවැය (Improvement Cost) පහත සීමාවන්ට යටත්ව අඩුව කළ (Deduct) යුතුය:

- **ගොඩනැගිලි (Building): 5%**
- **අවක්ෂය වන වෙනත් වත්කම් (Other depreciable assets): 20%**

ඉහත ප්‍රතිශත ගණනය කරනු ලබන්නේ පසුගිය වර්ෂය අවසානයේ පැවති වත්කමේ ශුද්ධ අගය (Written Down Value) මතය.

ඉහත සීමාවන් නිසා යම් වැඩිදියුණු කිරීමේ වියදමක් ඒ වර්ෂයේදී අඩුව කිරීමට නොහැකි වුවහොත්ල එම ඉතිරි (අතිරික්ත) වියදම් ප්‍රමාණය අදාළ වර්ෂයේ වත්කමේ ක්ෂය වීමේ පදනමට (Depreciation Basis) එකතු කළ යුතුය.

JMC vLearning

තේරුම සරලව

- පළමු පියවර: ඔබ ඔබේ ව්‍යාපාරික වත්කමක් වැඩිදියුණු කිරීමට (Improvement) වියදම් කළ විට, මුළු වියදමම එකවර එකම අවුරුද්දේ බද්දෙන් කපා හැරීමට (Deduct කිරීමට) බැහැ.
- සීමාව (Limit): එක අවුරුද්දකට කපා හැරිය හැකි උපරිම සීමාව වන්නේ, පසුගිය වසර අග පැවති ශුද්ධ අගය (Written Down Value) ගොඩනැගිලි සඳහා 5% ක් සහ වෙනත් වත්කම් (උදා: යන්ත්‍ර සූත්‍ර, වාහන) සඳහා 20% ක් පමණි.
- අතිරික්ත වියදම (Excess Expense): එම සීමාවට වඩා වැඩියෙන් ගිය වියදම් ප්‍රමාණය අපතේ යන්නේ නැත; එය ඊළඟ වසරවලදී ක්ෂය කිරීම (Depreciation) සඳහා අදාළ වත්කමේ මුළු වටිනාකමට එකතු කරනු ලැබේ.

ක්ෂය වන වත්කමක පසුගිය වර්ෂය අවසානයේ පැවති වත්කමේ ශුද්ධ අගය (Written Down Value) බිංදුවක් (Zero) වන අවස්ථාවක, වැඩිදියුණු කිරීමේ පිරිවැය අඩුව කිරීම (Deduct කිරීම) පහත සීමාවන්ට යටත්ව සිදු කළ යුතුය:

- ගොඩනැගිලි (Building): සමාන වසර 12 ක් ඇතුළත
- අවක්ෂය වන වෙනත් වත්කම් (Other depreciable assets): සමාන වසර 03 ක් ඇතුළත

- **15 වන වගන්තිය - පර්යේෂණ හා සංවර්ධන වියදම් සහ කෘෂි කාර්මික කටයුතු ආරම්භ කිරීමේ වියදම්**

මෙම වගන්තිය මගින් අවශ්‍යතා සපුරාලන ඉහත වියදමක් ඒවා අයභාර හෝ ප්‍රාග්ධන ස්වභාවයේ වුවද ඉඩ දෙනු ලැබේ.

i. පර්යේෂණ හා සංවර්ධිත වියදම් (Research & Development Expenditure)

ව්‍යාපාරයේ වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක, කාර්මික, කෘෂිකාර්මික හෝ වෙනත් පර්යේෂණ හෝ නව නිපැයුම් සඳහා වූ ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා වන හෝ නිෂ්පාදන ක්‍රියාවලී වැඩි දියුණු කිරීම සඳහා දැරූ වියදම් ඉඩ දෙනු ලැබේ.

නමුත් පරියේෂණ කටයුතු සඳහා මිලදී ගන්නා ලද උපකරණ වියදම් අඩු කිරීමට ඉඩ නොදේ.

ii. කෘෂි කාර්මික කටයුතු ආරම්භ කිරීමේ වියදම් යන්නෙන්

- ඉඩමක් වගාවට හෝ සත්ව පාලනයට සුදානම් කිරීමේ වියදම්
- එම ඉඩමේ පැළ වගා කිරීමේ වියදම්
- එම ඉඩමේ සතුන් ඇති කිරීම සඳහා සතුන් මිලදී ගැනීමේ වියදම්
- මසුන් ඇති කිරීම සඳහා ටැංකි, පොකුණු. ජලය සැකසීම, මසුන් මිලදී ගැනීමට දරන වියදම් ආදිය සම්පූර්ණයෙන් ඉඩ දෙනු ලබයි.

JMCVLearning

❖ **15 A වන වගන්තිය - අලෙවිකරන හා සන්නිවේදන වියදම්**

2021/04/01 දින සිට ව්‍යාපාරයේ ආදායම් ඉපයීම සඳහා දායක වූ අලෙවි කරන හා සන්නිවේදන වියදම් ඒවා ප්‍රාග්ධන සහ අයබාර ස්වභාවයේ වුව ද වියදමක් ලෙස අඩුකර ගැනීමට දෙනු ඇත.

මෙම වගන්තියට අනුව අලෙවිකරණ හා සන්නිවේදන වියදම් පහත පරිදි නිර්වචනය කර ඇත.

- පුද්ගලයෙකු හෝ ඔහු වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ඕනෑම ආයතනයක් විසින් වෙළඳපල පර්යේෂණයක් සිදු කිරීම;
- අලෙවිකරණය, ප්‍රචාරණ සහ සන්නිවේදනල ව්‍යාපාරයේ සංවර්ධනය හෝ නිෂ්පාදනය ශ්‍රී ලංකාව තුළ සිදු කරන ප්‍රමාණයට;
- ප්‍රධාන ධාරාවේ මාධ්‍යවල හෝ රූපවාහිනිය, ගුවන්විදුලිය, මුද්‍රිත හෝ එළිමහන් ප්‍රචාරණය ඇතුළු සමාජ මාධ්‍යවල ප්‍රචාරණය;
- එවැනි පුද්ගලයෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් ඕනෑම ප්‍රාදේශීය ආයතනයක් විසින් සිදු කරනු ලබන නිෂ්පාදන දියත් කිරීම් හෝ ප්‍රචාරණ සක්‍රීය කිරීම;
- පුද්ගලයෙකු විසින් හෝ වෙනුවෙන් ප්‍රාදේශීය ආයතනයක් විසින් භාණ්ඩ විකුණන අවස්ථාවේ ප්‍රචාරණ කටයුතු සඳහා ම මුද්‍රණය කරන ලද මුද්‍රිත ද්‍රව්‍ය.

❖ **16 වන වගන්තිය - ප්‍රාග්ධන දීමනා සහ තුලනය කිරීමේ දීමනා**

i. ප්‍රාග්ධන දීමනාව - Capital Allawances

<u>**ක්ෂය විය හැකි වත්කමක්**</u> පිළිබඳව සැලකීමේදී ව්‍යාපාරයේ ආදායම් ඉපයීම සඳහා අයිතිකරු විසින් අත්පත් කරගත් (කල්බදු වත්කම්ද ඇතුළුව) වර්ෂය තුල ආදායම් ඉපයීමට භාවිතා කළ, ක්ෂය විය හැකි වත්කමක් සඳහා පහත නියමයන්ට අනුකූලව <u>**ප්‍රාග්ධන දීමනා**</u> අඩුකර ගැනීමට මෙම වගන්තිය තුලින් ඉඩ දී ඇත.

සාමාන්‍ය අඩු කිරීම්

- ගිණුම්කරණ ක්ෂය වසරේ දක්වා ඇති අගය ඉඩ නොදෙන වියදමකි. එය නැවත ගැළපිය යුතුය.
- කොන්දේසි සපුරන ක්ෂය විය හැකි වත්කම් සඳහා ප්‍රාග්ධන දීමනා පහත ආකාරයට ගණනය කර අඩු කළ යුතුය.
  - ✓ මිලදී ගත් වර්ෂය සඳහා ක්ෂය පදනම (Depreciation Basis) මත අදාළ අනුපාතිකව ප්‍රාග්ධන දීමනා ලබාගත යුතුය. ක්ෂය පදනම වන්නේ පිරිවැය හෝ ඊට පසු එයට එකතු කළ අගයන්ගේ වටිනාකමයි.
  - ✓ සරළ මාර්ග ක්‍රමයට ප්‍රාග්ධන දීමනා ගණනය කළ යුතුය.
  - ✓ ඉවත් කරන වසරේ ප්‍රාග්ධන දීමනා අය නොකළ යුතුය.
  - ✓ මිලදී ගත් වර්ෂයටම ප්‍රාග්ධන දීමනාව ගණනය කරයි.

JMC Learning

- පනතේ 4 වන උප ලේඛනයේ සඳහන් ආකාරයට ප්‍රාග්ධන දීමනා ලබාගත යුතුය.

ඒ සඳහා පහත වගුව භාවිතා කරන්න.

2018/04/01 දින හෝ ඊට පසුව මිලදී ගත්/අත්පත් කරගත් වත්කම් සම්බන්ධව,

පන්තිය	ක්ෂය විය හැකි වත්කම්	වර්ෂ ගණන
01	පර්යන්ත උපකරණ සමඟ පරිගණක සහ දත්ත හසුරුවන මෙවලම්.	05
02	බස් රථ සහ කුඩා බස් රථ, බඩු වාහන, ඉදිකිරීම් සහ භූමි චලන මෙවලම්, බරැති සාමාන්‍ය කාර්යය හෝ විශේෂිත ට්‍රක් රථ, ට්‍රේලර් සහ ට්‍රේලර් සහිත කන්ටේනර් සහ නිෂ්පාදනයේදී භාවිතා කරන පිරියත සහ යන්ත්‍ර සූත්‍ර	05
03	දුම්රිය පාර මත ධාවනය කෙරෙන කාර් රථ, ජංගම යන්ත්‍ර සහ උපකරණ, යාත්‍රා, පාරු, ටග් බෝට්ටු සහ සමාන ජන ප්‍රවාහන උපකරණ, අහස් යානා විශේෂිත මහජන උපයුක්ත පිරියත උපකරණ සවි කිරීම් සහ උපකරණ, වෙනත් පන්තියක් තුල ඇතුලත් නොකරන ලද යම් ක්ෂය විය හැකි වත්කම්	05
04	ගොඩනැගිලි, ව්‍යූහ සහ ස්ථිර ස්වභාවයේ සමාන දේ.	20
05	කීර්ති නාමය හැර අස්පෘශ්‍ය වත්කම්	වත්කමේ සත්‍ය ඵලදායී ජීව කාලය හෝ එම ජීවකාලය අවිනිශ්චිත නම් වසර 20
06	දියර කිරි නිෂ්පාදනයට යොදා ගන්නා කිරි දොවන යන්ත්‍ර	02

2018/04/01 දිනට පෙර (තක්සේරු වර්ෂ 2018/19 පෙර) අත්පත් කරගත් වත්කම් වෙනුවෙන් ප්‍රාග්ධන දීමනාව පැරණි පනත අනුව පහත පරිදි හිමිකරගත යුතුය.

JMC vLearning

2018/04/01 දිනට පෙර කල්බදු පදනම මත අත්පත් කරගත් වත්කම් සම්බන්ධව ප්‍රාග්ධන දීමනාව හිමි නොවේ.

	වත්කම් වර්ගය	අත්පත් කරගත් වර්ෂය
		2011/12 - 2017/18
1.	පිරියත, යන්ත්‍ර හා උපකරණය - අපනයන කර්මාන්තය - අනෙකුත්	 33 1/3% 50%
2.	මෝටර්, වාහන හා ගෘහ භාණ්ඩ	20%
3.	ඕනෑම ඉදිකරන ලද සුදුසුකම් ලබන ගොඩනැගිලි	10%
4.	මිලදීගත් ඇතැම් ගොඩනැගිලි	6 2/3%
5.	අපනයනය කළ මෘදුකාංග	25%
6.	ශ්‍රී ලංකාව තුල සංවර්ධනය කළ මෘදුකාංග	100%
7.	තොරතුරු තාක්‍ෂණ උපකරණ, ගණක උපකරණ හා ඒවායේ උපාංග	25%
8.	කීර්තිනාමය හැර වෙනත් ඕනෑම අස්පෘශ්‍ය වත්කම්	10%

ඒ අනුව ක්ෂය ගැලපීම පහත පරිදි වේ.

විස්තරය	+	-
ගිණුම් ක්ෂය	xxx	-
ප්‍රාග්ධන දීමනා	-	xxx

ක්‍ෂය කළ හැකි වත්කමක් යනු, (Depreciable Asset)

යම් ව්‍යාපාරයකින් ආදායම් උපදවීම්හි ලා සේවානියුක්ත කරනු ලැබ සිටින ප්‍රමාණයක් දක්වා පමණක් වන්නා වූද, වැහැරීම් සහ ගෙවීයාම්, භාවිතය හෝ කාලය පසු වී යාම හේතුවෙන් එහි වෙළඳ අගය අඩු විය හැකි වන්නා වූද යම් වත්කමක් අදහස් වේ.

නමුත් ඊට,

කීර්තිනාමය, යම් ඉඩමක් හා ඇති සම්බන්ධතාවයක්, යම් අස්ථිත්වයක සාමාජිකත්වය සමබන්ධථාවයක් සහ වෙළඳ තොගය ඇතුලත් නොවේ.

JMC vLearning

ප්‍රාග්ධන වත්කම් යනු,

වෙළඳ තොග හා ක්ෂය කල හැකි වත්කම් හැර පහත ඕනෑම වත්කමක්,

(i) ඉඩම් හෝ ගොඩනැගිලි

(ii) සමාගමක හෝ හවුල් ව්‍යාපාරයක සාමාජික අයිතිය

(iii) සුරැකුම්පත් හෝ අනෙකුත් මූල්‍ය වත්කම්

ii. තුලනය කිරීමේ දීමනා සහ තක්සේරු කළ හැකි ගාස්තු (Balancing Allowance & Assessable Charges)

මෙය අදාල වන්නේ තක්සේරු වසර තුලදී උපලබ්ධි කරන ලද <u>ක්ෂය කළ හැකි වත්කම්</u> සඳහාය. එවැනි ගණුදෙණුවකදී බදු කටයුතු සඳහා ගැලපීම පහත පරිදි සිදු කළ යුතුය.

- එවැනි උපලබ්ධියක් මත ගිණුම්කරණ ගැලපිලි නැවත ගලපා අහෝසි කරන්න.
- ක්ෂය කළ හැකි වත්කමක් උපලබ්ධිය මත තුලනය කිරීමේ දීමනා හෝ තක්සේරු කළ හැකි ගාස්තු පහත පරිදි ගණනය කර ගලපන්න.

එම වත්කම් උපලබ්ධියෙන් ලද ප්‍රතිශ්ඨාව		xxx
අඩු : එම වත්කමේ බදු ලියාහල අගය		
එම වත්කමේ ක්ෂය පදනම	xxx	
මෙතෙක් ලබාගත් ප්‍රාග්ධන දීමනා	(xxx)	(xxx)
තක්සේරු කළ හැකි ගාස්තුව / (තුලනය කිරීමේ දීමනා)		**xxx**

විස්තරය	**+**	**-**
ක්ෂය වන වත්කම උපලබ්ධි මත ගිණුම්කරන ගැලපිලි		
- ලාභය	-	xxx
- අලාභය	xxx	-
ක්ෂය වන වත්කම මත ඉහත ගණනය කල		
- තක්සේරු කළ හැකි ගාස්තු	xxx	-
- තුලනය කිරීමේ දීමනා	-	xxx

JMC Learning

❖ **17 වන වගන්තිය - ව්‍යාපාර වත්කම් සතු බැරකම් උපලබ්ධි කිරීමේදී සිදුවන පාඩු**

17 වන වගන්තියට අනුව ව්‍යාපාරික වත්කම් හා බැරකම් උපලබ්ධි වීමෙන් සිදුවන පාඩු පහත පරිදි ගණනය කළ හැකිය.

	විකුණුම් ප්‍රතිශ්‍යාව		xxx
	<u>(-) පිරිවැය</u>		
(i)	අලුත්වැඩියා හා වැඩි දියුණු කිරීම් නඩත්තු වියදම්	(xx)	
(ii)	මිලදී ගැනීමේ / අත්පත් කර ගැනීමේ පිරිවැය	(xx)	
(iii)	ප්‍රචාරණය, පැවරුම් බදු හා නීතිඥ ගාස්තු	(xx)	(xxx)
	වත්කම් උපලබ්ධියෙන් සිදුවන (පාඩු) හෝ ලාභ		xxx

එලෙස පාඩු අඩු කල හැකි වන්නේ එය,

- ව්‍යාපාර ආදායම් ඉපයීමට භාවිතා කරන ලද ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කම් විය යුතුය.
- මුදල් ණයට ගැනීමේදී දුරූ ණය බැදීමක් නම්, ව්‍යාපාරයේ ආදායම් ඉපයීමට එම මුදල් යෙදවූතාක් දුරට හෝ එම මුදල් වලින් මිලදී ගත් වත්කමක් ව්‍යාපාරයෙන් ආදායම් ඉපයීමට භාවිතා කළ තාක් දුරට.
- වෙනත් බැරකමක් නම්, ව්‍යාපාරයෙන් ආදායම් ඉපදවීමට එම බැරකම දැරීමට සිදු වූ තාක් දුරට පමණි.

❖ **හිලව් නොකළ පාඩු**

යම් වර්ෂයක් සඳහා යම් තැනැත්තෙකුගේ තක්සේරු කළ හැකි ආදායම ගණන් බැලීමේදී යම් අලාභයක් අඩු කිරීම සඳහා 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ යම් විධානයක් මඟින් විධිවිධාන සලසා ඇති විටෙක සහ 2018 මාර්තු 31 වන දින එම අලාභය ඉතිරිව පවතින යම් ශේෂයක් 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත යටතේ 2018 අප්‍රේල් මස 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා උද්ගත වූ අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 19 වන වගන්තියේ ඉහත ප්‍රතිපාදන අනුව අඩු කළ හැකිය.

JMC vLearning

❖ **18 වන වගන්තිය - මූල්‍ය පිරිවැයෙහි අඩු කළ හැකි මුදල**

මෙම වගන්තිය අදාල වන්නේ **බැංකු හෝ මූල්‍ය ආයතන නොවන තැනැත්තන්ට වේ.** එවැනි තැනැත්තෙකුට මූල්‍ය පිරිවැය දැරීමේදී අඩු කළ හැකි උපරිම සීමා පනතේ දක්වා ඇත. එම ගැලපීම් පහත පරිදි වේ.

ඉඩනොදෙන මූල්‍ය පිරිවැය

$$\frac{\text{මූල්‍ය පිරිවැය}}{\text{ණය ප්‍රාග්ධනය}} \quad (4 \times \text{වර්ෂ අවසාන හිමිකම})$$

ණය ප්‍රාග්ධන යන්නට මූල්‍ය පිරිවැය දරන ලද මූල්‍ය සාධන පත්‍රවල වටිනාකම ගත යුතුය.

හිලව් නොකරගත් ප්‍රමාණයක් වේ නම් ඉදිරි තක්සේරු වර්ෂ 06 ක් තුල හිලව් කර ගත හැකිය.

සංචිත

සංචිත යනු ප්‍රත්‍යාගණන සංචිත හැර අනෙකුත් සංචිත වේ.

Section 18 යටතේ සංචිත (Reserves) එක ගණනය කිරීමේදී, සමාගම ලැබූ අතීත පාඩු (Negative retained earnings / Accumulated losses) කොටස් ප්‍රාග්ධනයෙන් (Issued share capital) අඩු නොකළ යුතුය.

ප්‍රායෝගික උදාහරණය

සමාගමක තොරතුරු:

- නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය (Issued share capital): රු. මිලියන 100
- ධනාත්මක සංචිත (Positive reserves): රු. මිලියන 20
- එක්රැස් වූ අලාභ / පාඩුව (Accumulated losses): රු. මිලියන 40
-

  නිවැරදි ගණනය කිරීම: පාඩුව (රු. මිලියන 40) අමතක කර, ප්‍රාග්ධනය සහ ධනාත්මක සංචිත පමණක් එකතු කරයි.

- Section 18 Base = රු. මිලියන 100 + රු. මිලියන 20 = රු. මිලියන 120
-

  වැරදි ක්‍රමය (මෙසේ නොකළ යුතුය): ප්‍රාග්ධනයෙන් පාඩුව අඩු කිරීම වැරදිය.
  රු. මිලියන 100 + රු. මිලියන 20 - රු. මිලියන 40 = රු. මිලියන 80 (වැරදිය)

JMC vLearning

❖ **19 වන වගන්තිය - ව්‍යාපාර හෝ ආයෝජන මත ඇති වූ පාඩු සඳහා ගැලපීම**

මෙම වගන්තිය යටතේ බදු සඳහා ගිණුම්කරණ ලාභ, ගැලපීමෙන් පසු ව්‍යාපාර හෝ ආයෝජන අලාභ අඩු කිරීම පිළිබඳ නිර්දේශ සපයයි.

මේ අලාභ ඇති වන්නේ ඉහත වගන්ති මත ගැලපීම නිසා වන අතර එය ප්‍රවර්තන වසරේ ඇති වූ හෝ පසුගිය වසර 6 ඇතුළත හිලව් නොකල ව්‍යාපාර පාඩුවක් (අලාභයක්) විය හැකිය.

- මෙම අලාභ ව්‍යාපාර ලාභයකින් අඩු කළ හැකි අතර හිලව් කල නොහැකි ප්‍රමාණය ඉදිරි තක්සේරු වර්ෂ 6 දක්වා ඉදිරියට ගෙන යමින් අඩු කළ හැකිය.
- සහන අනුපාත මත බද්දට යටත් වන ව්‍යාපාරයක ලාභය මත අලාභ අඩු කිරීමේදී එම සහන අනුපාත ලාභ මත පමණක් අඩු කිරීම කළ යුතුය. සාමාන්‍ය බදු අනුපාත මත බද්දට අදාල ආදායමින් ඒවා අඩු කළ නොහැක.
- බදු නිදහස් ව්‍යාපාරයක ලාභ මත අඩු කිරීමේ එම ව්‍යාපාරය මත අලාභ පමණක් අඩු කළ හැකිය.
- ව්‍යාපාර අලාභ ආයෝජන ආදායමට ද ගැලපිය හැකිය.
- නමුත් ආයෝජන අලාභ අඩු කළ හැක්කේ ආයෝජන ලාභ මත පමණකි.
- ආයෝජන වත්කමක උපලබ්ධි අලාභ වෙනත් ආයෝජන වත්කම් උපලබ්ධි ලාභයකට හිලව් කළ නොහැක.

❖ **24 වන වගන්තිය - බොල් ණය සහ බොල් ණය අයකර ගැනීම් පිළිබඳ ගැලපීම්**

- කපාහල බොල්ණය හෝ වියදමක් නැවත අයකර ගත් අවස්ථාවේ ආදායමක් ලෙස එකතු වේ.
- උපචිතව ආදායම හඳුනා ගත් විට එකී මුදල් නොලැබෙන බවට සාධාරණව ඔප්පු කළ හැකි විට බොල් ණය ලෙස එම අයකර ගත නොහැකි මුදල් අඩු කළ යුතුය.
- ලැබිය යුතු ආදායමක් නොලැබෙන බවට සනාථ වන විට එම මුදල බොල් ණය ලෙස කපා හැරීමට (අඩු කිරීමට) ඉඩ දෙනු ලැබේ.
- බැංකු ව්‍යාපාර ඇතුළු එම ආකාරයේ ව්‍යාපාර වලදී මුදල් අය කර ගැනීම සඳහා සාධාරණ පියවර ගෙන ඇති විට නොලැබූ මුදලක් කපා හැරීමට (බොල් ණය) ඉඩ දෙනු ලබයි.
- අඩමාණ ණය කිසිදු ආකාරයේ (විශේෂිත හෝ පොදු වෙන් කිරීම්) සඳහා වෙන්කිරීම් අඩු කිරීමට ඉඩ නොදේ.

JMCvLearning

හතරවන පරිච්ඡේදය
තක්සේරු වන ආයෝජන ආදායම හා තක්සේරුවන වෙනත් ආදායම්
(Assessable Investment Income & Assessable Other Income)

ඉගෙනුම් ඵල

මෙම පරිච්ඡේදය අවසානයේදී ඔබට,

- ආයෝජන ආදායම් යටතට අයත් දායම් මූලාශ්‍ර හඳුනාගැනීමට
- එම ආයෝජන ආදායම් සඳහා අදාළ රඳවා ගැනීමේ බදු අනුපාත සහ රඳවා ගැනීමේ බදු ගැලපීම් සිදුකරන ආකාරය පිළිබඳව
- තක්සේරුවන ආයෝජන ආදායම් ගණනයේ දී බදු සඳහා නිදහස් වන ආදායම් හඳුනාගැනීමට
- තක්සේරුවන ආයෝජන ආදායම ගණනය කරන ආකාරය පිළිබඳව මෙන්ම
- තක්සේරුවන වෙනත් ආදායම් ගණනය කරන ආකාරය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට හැකිවනු ඇත.

4.1 හැඳින්වීම

7 වන වගන්තිය

තැනැත්තෙකු විසින් තක්සේරු වසරක් තුලදී **ආයෝජන මත** තමන්ට **ලැබෙන ලැබීම්** සහ **ලාභ** එම වර්ෂය සඳහා ඔහුගේ ආයෝජන ආදායමකි. ආයෝජන ආදායම් හඳුනා ගැනීමේදී **මුදල් පදනම** සාමාන්‍යයෙන් භාවිතා කරයි.

මෙම වගන්තිය තුල තැනැත්තෙකුට උද්ගත වන පහත ලැබීම් ආයෝජන ආදායම් ලෙස දක්වා ඇත.

- ලාභාංශ, පොලී, වට්ටම්, අය කිරීම්, වාර්ෂික, ස්වාභාවික සම්පත් ගෙවුම්, කුලී, අධි මිල සහ රාජ්‍ය භාග
- ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලාබ
- ආයෝජනයක් සීමා කිරීම / භාර ගැනීමක් වෙනුවෙන් ලද මුදල්
- ආයෝජන මත එම තැනැත්තාට ලැබෙන ත්‍යාග
- ලොතරැයි, ඔට්ටු ඇල්ලීම හෝ සූදු ක්‍රීඩාවෙන් දිනුම් ලැබීම්
- මෙම පනත තුල සඳහන් වෙනත් මුදලක්

නමුත් මෙම ආයෝජන සඳහා පහත ආදායම් ඇතුලත් නොවේ.

- සේවා නියුක්ති ආදායම
- නිදහස් ආයෝජන ආදායම්
- අවසාන රඳවා ගත් බදු ගෙවූ ආදායම්
- ව්‍යාපාර ආදායම්

ආයෝජන ආදායම් පිළිබඳ සැලකීමේදී එක් එක් ආයෝජන ආදායම් මත සිදු කළ යුතු බදු ගැලපීම් පහත වේ.

4.2 ලාභාංශ ආදායම - Dividend Income - WHT 15% (Final Tax)

සමාගමක් විසින් ලාභ කොටස්, කොටස් හිමියන්ට බෙදා හැරීම මත ලාභාංශ ඇති වේ.

4.2.1 බදු නිදහස් ලාභාංශ (තුන්වන උපලේඛනය)

යම් වාසික සමාගමක් විසින් වෙනත් සමාගමකින් ලද ලාභාංශ මත ගෙවීමක් කර ඇත්නම් ලද ලාභාංශය බදු සඳහා නිදහස් ලාභාංශයක් ලෙස හඳුනාගත හැක්ිය.

4.3 පොලී ආදායම - Interest Income - WHT 10%

තැනැත්තෙකුගේ මුදල් ආයෝජන, තැන්පතු, ණයට දීම වැනි ක්‍රියා මාර්ග නිසා පොලී ආදායම් උද්ගත වේ. එම පොලී ආදායම මත දළ පොලිය ආදායම බදු සඳහා හඳුනාගත යුතුය.

4.3.1 බදු නිදහස් පොලී ආදායම් (3 වන උපලේඛනය)

(a) පුණ්‍ය ආයතනයක් ලද පොලී ආදායම් එම පොලී අවශ්‍ය තැනැත්තන්ට ආයතනිකමය රැකවරණය සපයන බවට දේශීය ආදායම් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන බව.

(b) 2018 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම තැනැත්තෙකුට හෝ ශ්‍රී ලංකා රජයට ප්‍රදානය කර ඇති යම් ණයක් මත ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකු විසින් උපයන පොලිය.

(c) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක විවෘත කර ඇති විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් මත උපයන පොලී ආදායම.

(d) 2018 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය, විදේශීය ව්‍යවහාර මුදලින් වටිනාකම නියම කර ඇති ස්වෛරී බැදුම්කර මත නිර්වාසියකයන්ට ගෙවන පොලිය.

(e) ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර ද ඇතුලත් ම වටිනාකමට අදාල විදේශ ව්‍යවහාර මුදලින් තීරණය කර ඇති ඕනෑම ස්වෛරී බැදුම්කරයක් මත ගෙවන ලද පොලිය.

JMC vLearning

4.4 කුලී ආදායම - Rent Income - WHT 10%

තැනැත්තෙකු තමන්ගේ දේපල කුලියට දීමෙන් මෙම ආදායම උද්ගත වේ.

- එම කුලියට දීම තවත් සාමාන්‍ය පුද්ගලයෙකුට දී ඇති විට දළ කුලිය ඔහුගේ ආදායම වේ.
- ම කුලියට දීම රඳවාගත් නියෝජිතයෙකුට දී ඇති විට (ව්‍යාපාරික) ඔවුන් විසින් කුලිය මත රඳවාගත් බද්දක් අය කර ශුද්ධ කුලිය අයිතිකරුට ලබා දේ. එවිට පහත ආකාරයට දළ කුලිය සොයාගත යුතුය.
- කුලී ආදායම් ගණනයේදී එකී දේපල කුලිය දීමට අදාල වියදම් අඩු කල හැකි වේ.
  උදා: වරිපනම්, ප්‍රචාරණ වියදම්
- තනි පුද්ගලයින් සඳහා අළුත් වැඩියා සහ ක්ෂය වියදම් සඳහා පනතේ 52 වගන්තිය මත 25% සුදුසුකම් සහනයක් කුලී තක්සේරු ආදායම මත ලබා ගැනීමෙන් හෝ සත්‍ය වියදම් ඊට වැඩි නම් සත්‍ය වියදම අදාල පරිදි අඩු කර ගැනීම සිදු කළ යුතුය. (එකවිට මෙම දෙවර්ගයම අඩු කළ නොහැකි බව මතක තබාගත යුතුයි) - 5 වන උපලේඛනය

4.5 අනිකුත් ආයෝජන ආදායම් මත රාජ්‍ය භාග වැනි ආදායම් දළ ආදායම, බද්දට යටත් වේ.

4.6 මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වෙන්දේසි විකිණීමෙන් වන 2.5% රඳවා ගැනීමේ බද්දක් අයකරන අතර එකී ලැබීමක් නැවත බද්දට යටත් නොවේ. එම අඩු කල බද්ද අවසාන බද්දකි.

4.7 සූදු, ඔට්ටු හෝ ලොතරැයි දිනුම් ලැබීමේ ආදායම් - WHT 14% (Final Tax)

මෙම ආදායම් ලැබීමේදී පහත නියමයන් අදාල වේ.

- රු. 500,000 දක්වා එවැනි දිනුමක් ආදායම් බද්දෙන් නිදහස් වීම. (3 වන උපලේඛනය)
- රු. 500,000 වැඩි දිනුම් 14% රඳවා ගැනීමේ බද්දට යටත්ව ලැබේ. (84 වගන්තිය)
- එලෙස අඩු කළ රඳවාගත් බද්ද අවසාන බද්දකි. (88 වගන්තිය)
- එලෙස රඳවා ගත් බදු අඩු කර ඇති විට එම දිණුම් ආදායම නැවත බද්දට යටත් නොවේ.

4.8 ආයෝජන ප්‍රතිලාභ වලින් බද්ද රඳවා ගැනීම (34 වගන්තිය)

84, 84(අ) හා 85 වගන්තිය අනුව, පහත ගෙවීම් වලින් කරන අවස්ථාවේදී අදාළ අනුපාතය යටතේ රඳවා ගැනීමේ බදු අඩු කළ යුතුය.

JMC vLearning

ගෙවීම් වර්ගය	AIT/WHT අනුපාතය
පොළිය හෝ වට්ටම්	10%
වාසික තැනැත්තෙකුට ගෙවනු ලබන කුලිය	10%
වාසික නොවන තැනැත්තෙකුට ගෙවනු ලබන කුලිය	14%
රාජ්‍ය සහන, අධි මිල, ගාස්තු, ස්වභාවික සම්පත් ගෙවීම්, විශ්‍රාම ගෙවීම්, ලොතරැයි, ත්‍යාග ඔට්ටු හෝ සූදු දිනුම්	14%
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ වෙන්දේසියක ද විකුණනු ලබන මැණිකක විකුණුම් මිල මත	2.5%
ලාභාංශ (Final Tax)	15%
ගෙවුම්කරුගේ සේවකයෙකු නොවනල නේවාසික තනි පුද්ගලයෙකු වෙත කරනු ලබන සේවා ගාස්තු ගෙවීම් (කැලැන්ඩර් මාසයක් තුළ සිදුකරන මුළු ගෙවීම රුපියල් 100,000 ඉක්මවන්නේ නම්) (a). ඉගැන්වීමල දේශන පැවැත්වීමල පරීක්ෂණ පැවැත්වීමල විභාග නිරීක්ෂණය හෝ අධීක්ෂණය කිරීම සඳහා (b). නේවාසික රක්ෂණල අලෙවි ප්‍රචාරක නියෝජිතයෙකු වෙත ගෙවන කොමිස් මුදලක් හෝ තැරැව්කාර ගාස්තුවක් ලෙස හෝ (c). ස්වාධීන සේවා සැපයුම්කරුවෙකුගේ තත්ත්වයෙන් අදාළ තනි පුද්ගලයා විසින් සපයනු ලබන සේවාවන් සඳහා (උදාහරණ ලෙස වෛද්‍ය, ඉංජිනේරු, ගණකාධිකාරී, නීතිඥ, මෘදුකාංග සංවර්ධක, පර්යේෂක, අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රඥල විගණක, මොඩලර්, පෞද්ගලික ශාරීරික උපදේශක (Personal Trainer), ක්‍රීඩා උපදේශක :ක්ජය*ල තක්සේරුකරුල චිත්‍ර ශිල්පී, රංගන ශිල්පී, නර්තන ශිල්පී, ගායක, වාදක, උත්සව සංවිධායක, ඡායාරූප ශිල්පී, වීඩියෝ ශිල්පී, චිකිත්සක (Therapist), උපදේශක (Counsellor), රූපලාවන්‍ය ශිල්පී, සූපවේදී, විදුලි කාර්මික, දන්ත වෛද්‍යල පශු වෛද්‍ය, සමාජ මාධ්‍ය විශේෂඥල සන්නාම තානාපති (Brand Ambassador), ක්‍රීඩකල තොරතුරු තාක්ෂණ විශේෂඥ වැනි ක්ෂේත්‍ර)	5%

චක්‍රලේඛ අංක SCE/2026/E/04 (Circular No: SEC/2026/E/04) බලන්න.

JMC vLearning

4.9 ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලාභ (ප්‍රාග්ධන ලාභය)

ආදායම් බදු කාර්යය සඳහා ප්‍රාග්ධන ලාභය ආයෝජන ආදායමක් ලෙස සලකයි. ඒ අනුව ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලාභ, **ප්‍රාග්ධන ලාභ** ලෙස සලකයි.

195 වගන්තියට අනුව ආයෝජන වත්කමක් යන්නෙන්,

(අ) යම් ආයෝජනයක කොටසක් ලෙස දරනු ලබන ප්‍රාග්ධන වත්කම් සහ

(ආ) ඊට යම් පුද්ගලයෙකු ප්‍රධාන වශයෙන් පදිංචි ස්ථානය (අවුරුදු 03 ක හිමිකාරීත්වය දරා ඉන් අවුරුදු 02 ක් අවම වශයෙන් එහි පදිංචිව සිටියේ නම් අදාල නොවේ)

ප්‍රාග්ධන වත්කම් යන්නෙන් පහත දැක්වෙන වත්කම් අදහස් වේ.

(i) ඉඩම් හෝ ගොඩනැගිලි

(ii) යම් සමාගමක් හවුල් ව්‍යාපාරයක් හෝ භාරයක් පිළිබඳව යම් සාමාජිකත්ව සම්බන්ධතාවක්

(iii) යම් සුරකුම්පතක් හෝ වෙනත් යම් මූල්‍ය වත්කමක්

(iv) ඉහත සඳහන් යම් වත්කමක් පිළිබඳව යම් වරණයක්, අයිතිවාසිකමක් හෝ වෙනත් සමබන්ධතාවක්

නමුත්, වෙළඳ තොගය හෝ ක්ෂය විය හැකි වත්කම් ඊට ඇතුළත් නොවේ.

ප්‍රාග්ධන ලාභය/අලාභය = ලද ප්‍රතිශ්ඨාව - වත්කමේ පිරිවැය

ලාභය තීරණය කිරීමේදී පහත කරුණු සැලකිල්ලට ගත යුතුය.

- වත්කම ආයෝජන වත්කමක් වන්නේ ද යන්න.
- වත්කම උපලබ්ධි කිරීමට පෙර ව්‍යාපාරයකට කිසිදු ආකාරයකින් සම්බන්ධ වූ කාර්යකට භාවිතා නොකළ බව.
- වාසික තැනැත්තෙකු සඳහා ගණනය කළ ලාභය රු. 50,000 ක් නොඉක්මවන බව.

<u>වත්කමක පිරිවැය (37 වගන්තිය)</u>

	වත්කම අත්පත් කර ගැනීමේ වියදම්	xxx
(+)	වත්කම වෙනස් කිරීමේදී දැරූ වියදම් (වැඩිදියුණු කිරීමේ, නඩත්තු කිරීමේ, අලුත් වැඩියා කිරීමේ වියදම්)	xxx
(+)	අත්පත් කර ගැනීමේදී හෝ උපලබ්ධියේදී දරන ලද අනුසංගික වියදම් (ප්‍රචාරණ, පැවරුම් බදු, නීතිඥ ගාස්තු)	xxx
	වත්කමේ පිරිවැය	xxx

2017/09/30 දිනට පෙර මිලදී ගත් වත්කමක් සම්බන්ධව එදිනට වෙළඳපොල අගය අත්පත් කරගත් පිරිවැය ලෙස සැළකිය යුතුය.

JMC Learning

4.9.1 බදු නිදහස් ප්‍රාග්ධන ලාභ (3 වන උපලේඛනය)

- මිල ලැයිස්තුගත සමාගමක කොටස් විකිණීමෙන් උපලබ්ධි වූ ලාභය.
- ආයෝජන වත්කම් උපලබ්ධි ලාභය රු. 50,000 දක්වා (එක් ආයෝජන වත්කමක් මත).
- වාසික තැනැත්තෙකු තමාගේ ප්‍රධාන නිවස උපලබ්ධියෙන් ඇතිවන ලාභය මත පහත කොන්දේසි සම්පූර්ණ වේ නම් බද්දෙන් නිදහස් වේ.
  (a) එම තැනැත්තාට උපලබ්ධි පෙර වසර 03 ක් හෝ ඊට වැඩි කාලයක් නිවස අයිතිව තිබීම.
  (b) එම අයිති වසර 03 තුල අවම වශයෙන් වසර දෙකක් එම තැනැත්තා එම නිවසේ පදිංචි වී සිටීම. (දෛනික පදනම මත කාලය ගණනය කල යුතුය)

rning

ප්‍රාග්ධන ලාභ මත බදු අනුපාතය 2026/27 (after 03rd of June 2026)

Inland Revenue (Amendment) Act, No.11 of 2026

	Before 2nd June 2026	On or after 2nd June 2026
තනි පුද්ගල	10%	15%
හවුල් ව්‍යාපාර	10%	15%
භාර	10%	30%
ඒකක භාර සහ අන්‍යෝන්‍ය අරමුදල	10%	30%
රාජ්‍ය නොවන සංවිධාන	10%	30%
සමාගම්	30%	30%

තක්සේරු වන වෙනත් ආදායම් (8 වන වගන්තිය)

(Assessable Other Income)

4.10 හැඳින්වීම

යම් තක්සේරු වර්ෂයක් සඳහා වෙනත් මූලාශ්‍රවලින් යම් තැනැත්තකුට ලැබෙන ආදායම, එම වර්ෂය සඳහා කවර හෝ මූලාශ්‍රයකින් එම තැනැත්තාට ලැබෙන ලැබීම් සහ ලාභ විය යුතු අතර, ඊට අනියම් සහ පුනරාවර්තන නොවන ස්වභාවයේ ලාභ ඇතුළත් නොවේ.

වෙනත් මූලාශ්‍රවලින් තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීම.

වෙනත් මූලාශ්‍රවලින් ආදායම්		XXX
අඩු කළා -		
බදු නිදහස් ආදායම්	(XX)	
අවසාන රඳවා ගැනීමේ ගෙවීම්	(XX)	
සේවා නියුක්ති ව්‍යාපාර හෝ ආයෝජන ආදායමට ඇතුළත් ආදායම්	(XX)	(XX)
බද්දට යටත් වෙනත් ආදායම්		XXX
අඩු කළා - ඉඩ දෙන වියදම්		(XX)
තක්සේරු කළ හැකි වෙනත් ආදායම්		**XXX**

Lecturer:
Mr. Nuwan Sameera
ACA, ACPM, CTA(Reading), ACCA (finalist), M.Sc. in MGT SJP,
B.Sc. (Accounting) Special 1st Class SJP, CTHE (RUSL),
Lecturer at State University in Sri Lanka

JMCvLearning